# විද්වත් මණ්ඩල යෝජනා හා ප්‍රශ්නයේ ස්වභාවය

ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම සඳහා ජනාධිපතිතුමන් විසින් කැඳවන ලද සර්වපාක්ෂික සම්මේලනයට අමතරව එතුමන් විසින් පත්කරන ලද මණ්ඩල දෙකක් වෙයි. එකක් විද්වත් මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන අතර අනෙක සර්වපාක්ෂික නියෝජිත කමිටුව ලෙස නම්කෙරී ඇත. සර්වපාක්ෂික සම්මේලනයට ආරාධනාකෙරී එයට සහභාගිවන එක් එක් පක්ෂය එක් නියෝජිතයා බැගින් සර්වපාක්ෂික නියෝජිත කමිටුවට නම්කර ඇත. නම්කෙරීම පක්ෂ මගින් කෙරුණ ද පත්කිරීම ජනාධිපතිතුමා විසින් කරන ලදී. විද්වත් මණ්ඩලය ද ජනාධිපතිතුමා විසින් පත්කරන ලද මහත්ම මහත්මීන් ගෙන් සමන්විත වෙයි. එහි සාමාජිකයෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ දැනුමක් ඇත්තෝ වෙතියි කියැවෙයි. සර්වපාක්ෂික නියෝජිත කමිටුව දේශපාලන වශයෙන් විසඳුම් සාකච්ඡාකර අවසානයේ දී ජනාධිපතිතුමාට හා සර්වපාක්ෂික සම්මේලනයට වාර්තා කළයුතු ය. විද්වත් මණ්ඩලය සර්වපාක්ෂික සම්මේලනයට ද සර්වපාක්ෂික නියෝජිත කමිටුවට ද සහාය වෙයි. පසුගිය හයවැනි බදාදා විද්වත් මණ්ඩලයේ බහුතරයේ මූලික වාර්තාව යැයි කියැවෙන්නක් ද, සුළුතරයේ අතුරු වාර්තාව යැයි කියැවෙන්නක් ද සාමාජික භවතුන් දෙදෙනකුගේ ලියැවිලි දෙකක් ද විද්වත් මණ්ඩලයේ හා සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ ඒකාබද්ධ රැස්වීමක දී ඉදිරිපත්කෙරිණි. ඒ වාර්තා එයට කලින් දින ජනාධිපතිතුමාට ඉදිරිපත්කළ බව කියැවෙයි. එහෙත් විද්වත් මණ්ඩලයේ බහුතරයේ වාර්තාව ඉන්දියාවේ පළවන හින්දු පුවත්පතට කලින් ම දැනගැනීමට ලැබී ඇති බව පැහැදිලි ය. විද්වත් මණ්ඩලයේ හා සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ ඒකාබද්ධ බද්ධ රැස්වීමෙහි දී තීරණය වූයේ සියළු වාර්තා හා ලියැවිලිවල රහස්‍යභාවය රැකීමට ය. එහෙත් ඒ වන විටත් බහුතරයේ වාර්තාව හින්දු පුවත්පතට ලැබී අවසන් ය. වාර්තා හා ලියැවිලි පිළිබඳ සාකච්ඡාවක් සිකුරාදා ම පුවත්පත්වල ඇරඹිණි. සර්වපාක්ෂික කමිටුවේ මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරන තැනැත්තා ලෙස මම ඉන් මහත් කණස්සලට පත්වීමි. වාර්තා අප අතට පත්වූයේ ද බදදා රාත්‍රියෙහි ය. සිකුරාදා ඒ පිළිබඳ සාකච්ඡාව ඇරඹුණේ හින්දු පුවත්පත ඒ පිළිබඳ කලින් දැනසිටි බව ද හෙළිදරවුකරමිනි. ප්‍රසිද්ධ වූ වාර්තාවක් ගැන නිහඬ ව සිටීමට නොහැකි බැවින් වඩා භයානක වාර්තාව වූ බහුතරයේ වාර්තාව මුළුමනින් ම ප්‍රතික්ෂේපකරන බවට වහාම ප්‍රකාශයක් කෙළෙමි. එහෙත් අවාසනාවකට එය පළවූයේ දි අයිලන්ඩ් පුවත්පතෙහි පමණකි. අද තිබෙන තත්වය අනුව ඒ වාර්තා සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ සාකච්ඡාවට බඳුන් නො වෙයි. එහෙත් එහි යම්කිසි නියෝජිතයකුට අවශ්‍ය නම් ඒ ගැන සඳහන්කළ හැකි ය.

බහුතර වාර්තාවට එකොළොස් දෙනකු අත්සන් තබා ඇත. කොටි සංවිධානයට විරුද්ධව එහෙත් දෙමළ ජාතිවාදයට පක්ෂව ලියන එක් පඬියකු වාර්තාව අනුමතකරමින් කියා තිබුණේ එයට සිංහලයන් හය දෙනකු දෙමළ හතරදෙනකු හා එක් මුස්ලිම් අයකු අත්සන් තබා ඇති බවත් එබැවින් ඒ වාර්තාව සිංහලයන් පමණක් අත්සන් කර ඇති අනෙක් වාර්තාවට හා ලියවිලිවලට වඩා මෙරට බහුවාර්ගිකත්වය නියෝජනයකරන බවත් ය. එහෙත් ඔහු අමතකකරන කරුණු බොහෝ ය. වාර්තාවට අත්සන්කළ සිංහලයන් හයදෙනාගෙන් තුන්දෙනෙක් ම රාජ්‍ය සේවකයෝ වෙති. ඔවුන්ට ඒ වාර්තාවට අත්සන් තැබීමට සුදුසුකම් නැත. ඔවුහු විද්වත් මණ්ඩලයේ සාමාජිකයෝ නොවෙති, ඔවුහු නිල බලයෙන් මණ්ඩලයෙහි කටයුතුවලට සහභාගි වෙති. එවිට වාර්තාවට අත්සන්කර ඇත්තේ සිංහලයන් තුන්දෙනකු පමණ ය. සිංහලයන් හයදෙනෙක් ම වාර්තාව සමග එකඟ නො වෙති. වෙනත් වචනවලින් කියන්නේ නම් මණ්ඩලයේ සිංහලයන්ගෙන් වාර්තාවට එකඟවන්නේ තුනෙන් එකක් පමණ ය. වාර්තාවට එකඟවන සිංහලයන් තුන්දෙනා මෙරට සිංහල ජනතාව නියෝජනය කරත් ද? මාක්ස්වාදීන්, හිටපු මාක්ස්වාදීන්, ලිබරල්වාදීන් වන මේ පිරිස් ප්‍රශ්න දෙස බලන්නේ විජාතික මතවාද ඇසුරෙන් ය. රාජ්‍ය නොවන සංවිධාන සමග ඔවුන් පවත්වන සම්බන්ධකම් කවරේ ද? විද්වත් මණ්ඩලයට කුප්‍රකට බර්ග්හොෆ් සංවිධානය ඉදිරිපත්කළ සංදේශය කුමක් ද? බර්ග්හොෆ් ආයතනයෙන් එවූ සංදේශය සලකා බැලෙත්දී ජනතාවගේ සංදේශවලින් ඉතා වැඩි ප්‍රමාණයක් මණ්ඩලය විසින් සලකා නොබැලුණේ ඇයි?

පැහැදිලිව ම වාර්තාව ඉදිරිපත් වී ඇත්තේ යම්කිසි පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක අවශ්‍යතාව පරිදි ය. ඔවුන් පිටුපස යම් විජාතික බලවේග වෙයි. ඒ බලවේගවලට අවශ්‍ය වූයේ ද ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට පිළිතුර විද්වත් මණ්ඩලයේ බහුතරයේ වාර්තාව යැයි හඬනගා කීමට ය. මේ වාර්තාව බහුතරයේ වාර්තාව බවට හුවාදක්වන පුවත්පත් හා රාජ්‍ය නොවන සංවිධාන රටක් ලෙස ගත්විට බුහතරයේ මතය දැඩි ලෙස විවේචනයකරයි. ඔවුන් එහි දී කියන ප්‍රධාන කරුණ නම් සිංහල බහුතරය තම බහුතර ඡන්ද බලය යොදාගනිමින් සුළුතර ජනවර්ගවල අයිතිවාසිකම්

නොදෙන බව ය. එහෙත් ඔවුහු විද්වත් මණ්ඩලයේ බහුතරයේ වාර්තාව හුවාදක්වති. විද්වත් මණ්ඩලයට සාමාජිකයන් පත්කිරීමේ දී සිංහලයන් අතරින් ද දෙමළ ජාතිවාදී මත දරන්නන් පත්කෙරුණේ කෙසේ ද? විද්වත් මණ්ඩලයේ බහුතරය රටේ ජනතාවගේ බහුතරය නියෝජනය නොකරන බව පැහැදිලි ය. කසිකබල් සතිඅන්ත පත්තර කඩමාළු ඇතුළු දෙමළ ජාතිවාදී පත්තරවලට, රාජ්‍ය නොවන සංවිධානවලට හා වෙනත් එවැන්නන්ට අවශ්‍ය වී ඇත්තේ දෙමළ ජාතිවාදයේ අභිලාෂය ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම ලෙස ඉදිරිපත්කිරීම ය. විද්වත් මණ්ඩලයේ බහුතර වාර්තාව ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට ජනවාර්ගික විසඳුමක් ඉදිරිපත්කරයි. ඒ විසඳුමට අනුව කඳුකරයේ ද දෙමළ කලාපයක් බිහිවෙයි. නැගෙනහිර පළාතේ භූගෝලීය වශයෙන් එකිනෙකට සම්බන්ධ නැති ප්‍රදේශවලින් සමන්විත මුස්ලිම් කලාපයක් බිහිවෙයි. එවැනි කලාපයක් අනුගමනයකරමින් අනෙක් පළාත්වලද ජනවාර්ගික පදනමක් මත සන්තතික නොවන කලාප බිහිවනු ඇත. රටෙහි අන් කලාපවලින් වෙන්වූ, වටවූ ජනවාර්ගික කලාප බිහිකිරීම ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයකට විසඳුම නො වෙයි. ඉන් ප්‍රශ්නය තව තවත් උග්‍රවනු ඇත. දිගින් දිගට ම මහජනයා අතින් ප්‍රතික්ෂේපවන පක්ෂවල මතය විවිධ උපාමාරුවලින් විසඳුම ලෙස ඉදිරිපත්කිරීමට ගන්නා වෑයම මගින් මුළු රටම අගාධයකට හෙළනු ඇත. මෙරට ඇති ප්‍රශ්නය කුමක් හෝ වේවා ඒ විසඳාගැනීමෙහිලා ප්‍රධාන බාධකය වී ඇත්තේ සියළු දෙනාම එකතු වීත් රටෙන් ම ඡන්ද පන්දාහක් ලබාගත නොහැකි කසිකබල් මාක්ස්වාදීන්, හිටපු මාක්ස්වාදීන්, පශ්චාත්මාක්ස්වාදීන්, ලිබරල්වාදීන් ආදී බංකොළොත් දේශපාලනඥයන් බටහිරින් ආනයනය කර වමාරන අවලංගු වී ඇති මත ය. මේ කිසිම පක්ෂයකට හෝ කණ්ඩායමකට හෝ පාර්ලිමේන්තුවේ ඡන්දයෙන් පත්වූ එකදු මන්ත්‍රීවරයකු නැතිබව මතක්කිරීම වැදගත් වෙයි. අවසාන විග්‍රහයෙහි දී බටහිරයන් විසින් නඩත්තුකෙරෙන මේ කසිකබළුන් පැත්තකට දමා සන්ධීය රාජ්‍යයක් ඉල්ලන, කොටි නොවන දෙමළ දේශපාලන පක්ෂ හා ඒකීය රාජ්‍යයක් ගැන කතාකරන සිංහල දේශපාලන පක්ෂ අතර පමණක් සාකච්ඡාවක් පැවැත්වෙන්නේ නම් ප්‍රශ්නය කුමක් වුවත් එයට විසඳුමක් සොයාගත හැකි ය. කෙසේ හෝ වේවා ආණ්ඩුව විද්වත් මණ්ඩලයේ බහුතර වාර්තාව තම මතය නොවන බව ප්‍රකාශකිරීම වැදගත් ය.

විද්වත් මණ්ඩලයේ බහුතරය ප්‍රශ්නය හඳුනාගන්නා ආකාරය ම වැරදි ය. ඔවුන්ට අනුව ප්‍රශ්නය ඇති වී තිබෙන්නේ බහුවාර්ගික බහු ආගමික රටක් වුව ද සංඛ්‍යාත්මක ව සුළුතරයක් වූ ජනවර්ගවලට රාජ්‍ය බලයෙහි ලැබිය යුතු කොටස නොලැබීම නිසා ය. මෙය මුළුමනින් ම අසත්‍යයකි. අද පවා කැබිනට් මණ්ඩලයෙහි සුළුතර ජනවර්ග නියෝජනයකරන ඇමතිවරු කොපමණ වෙත් ද? දෙමළ ජාතිවාදී මතය නියෝජනය කරන පාරාජික සමසමාජ කොමියුනිස්ට් පක්ෂවල හා චන්ද්‍රිකා කණ්ඩායමේ ඇමතිවරු ද ගතහොත් කැබිනට් මණ්ඩලයේ ඉතා වැඩි පිරිසක් සිංහලත්වයට මෙරට හිමිවිය යුතු තැන දීමට විරුද්ධවෙති. ශ්‍රී ල නි පක්ෂයේ මේ ඇමතිවරු පක්ෂයෙන් ඉවත්වුවහොත් හෝ ඉවත්කළහොත් හෝ බලයක් නැත්තවුන් පිරිසක් බවට පත්වෙති. ඔවුන්ට ඒ බව අමතක ය. අද ඔවුන් කරන්නේ අගේ ඉඳන් කණ කැමකි. මෙරට ප්‍රශ්නය ලන්දේසීන් විසින් දුම්කොළ වගාවට ආනයනය කරනු ලැබ යාපන අර්ධද්වීපයේ බලවතුන් බවට පත්වූ දෙමළ ප්‍රභූන්ට බ්‍රිතානීන් සංඛ්‍යාව, ඉතිහාසය නොසලකා වරප්‍රසාද ලබාදීම ය. ඒ වරප්‍රසාද අතර ව්‍යවස්ථාදායකයෙහි සිංහල ප්‍රභූන් හා සංඛ්‍යාත්මකව සමානකරමින් ලබාදුන් වරප්‍රසාදය ද වෙයි. දෙමළ දේශපාලනඥයන්ගෙන් මේ වරප්‍රසාද ස්වාභාවිකව ඉවත්වන විට ඔවුහු දෙමළ ජනයාට අසාධාරණයක් වන්නේ යැයි කියමින් සාමාන්‍ය දෙමළ ජනයා සිංහලයන්ට විරුද්ධව උසිගැන්වූහ. ඔවුහු සිංහලත්වයට මෙරට හිමිතැන අහිමිකිරීමට බ්‍රිතානි ආණ්ඩුකාරයන් සමග එක්ව සටකපටකම් කළහ. ප්‍රශ්නයේ ආරම්භය එයයි. විසඳුමක් සෙවිය යුත්තේ ඒ ප්‍රශ්නයට මිස ඊනියා දෙමළ අභිලාෂවලට නොවේ. සිංහලත්වයට හිමිතැන අහිමිකිරීමට දෙමල ජාතිවාදීහු බහුවාර්ගික බහුබූතය ඉදිරිපත්කරති. ලෝකයේ අනෙක් රටවල බහුවාර්ගික යන්නෙන් අදහස්කරන්නේ ඒ ඒ රටෙහි ප්‍රධාන, බොහෝවිට අධිපතිවාදී සංස්කෘතියක් ඇති අතර වෙනත් සංස්කෘතීන් ද පවතින බව ය. යුරෝපීය රටවල මුස්ලිම් කාන්තාවන්ට අද තම වාර්ගික ඇඳුම ඇඳීමේ නිදහස නැත. අනෙක් අතට මලයාසියාවේ ජාතික පාසල්වල දෙමළ චීන සිසුන්ට භාෂා මැලේ ලෙස හැඳින්වෙන බසින් ඉගෙනීමට බලකෙරෙයි. ලංකාවේ එවැනි දේ නො සිදුවෙයි. එහෙත් සියල්ලෝ සිංහල මුවහමට තඩිබාති. එලෙස තඩිබා සිංහලයා චූදිතයාකර ප්‍රශ්න විසඳිය නො හැකි ය. මේ තඩිබෑමට හේතුව නිවට ව්‍යාජ සිංහල දේශපාලනය ය. සිංහල ජාතිකත්වය හා දෙමළ ජාතිකත්වය අතර වෙනසක් වේ. දෙමළ ජාතිකත්වයට නායකත්වය දෙන්නේ දෙමළ දේශපාලනඥයන් ය. එහෙත් සිංහලයන්ට නායකත්වය ලැබෙන්නේ භික්ෂූන් වහන්සේගෙන් හා ජාතිකත්වය අගයන ගිහියන්ගෙනි. සිංහල දේශපාලනඥයන් බොහෝ විට කරන්නේ සිංහලයන්ගේ ඡන්ද ලබාගැනීම සඳහා ජාතිකත්වය පසුපස යෑම ය. එහි ඇත්තේ ව්‍යාජත්වය පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva